# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2346/48 – 2023 අගෝස්තු මස 24 වැනි බ්‍රහස්පතින්දා – 2023.08.24**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/05/2018/150.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2019.05.09 දිනැති හා අංක 2122/39 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2019.05.03 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කැළණිය, දළුගම, පරණ නුවර පාර, අංක 275/1 හි පදිංචි යමුනා විනෝදනී ද අල්විස් මිය සහ කොළඹ 07, නිදහස් චතුරශ්‍රය හි පිහිටි ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 47/2019 හා 2023.07.20 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 අගෝස්තු මස 10 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කොළඹ බේරුම්කරණ අංශය සහ කාර්මික අධිකරණයේ දී ය**

යමුනා විනෝදනී ද අල්විස්,
අංක 275/1, පරණ නුවර පාර,
දළුගම, කැළණිය.

*පළමු පාර්ශ්වය.*

*නඩු අංකය :* ඒ/47/2019
IR/COM/05/2018/150.

*එදිරිව*

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

*දෙවැනි පාර්ශ්වය.*

**බලතල පැවරීම :**

කම්කරු හා වෘත්තීය සබඳතා හිටපු අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මහතා වෙත 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවිය යුතු) දරන පනත්වලින් සංශෝධිත ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව පහත දැක්වෙන ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා මා වෙත පවරා ඇත.

**උද්ගතව පවතින ආරාවුලේ ස්වභාවය :**

මෙහි පළමු පාර්ශ්වය වන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සහකාර අධ්‍යක්ෂ (සංගීත) ලෙස කටයුතු කර ඇති යමුනා විනෝදනී ද අල්විස් යන අයට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30/2006 හා 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි MM 1:1 වැටුප් පරිමාණයේ කාණ්ඩ ගතකර වැටුප් සංශෝධනය කළ ද, හිඟ වැටුප් දීමනා හා අනෙකුත් හිමිකම් ලබා නොදීමෙන් ඇයට අසාධාරණයක් සිදුව තිබෙන බවට පළමු පාර්ශ්වය අදහස් කිරීමත් දෙවන පාර්ශ්වය එය එලෙසින්ම පිළිනොගැනීමත් හේතු කර ගෙන මෙම ආරාවුල උද්ගතව පවතී.

**පවත්නා ආරාවුල සම්බන්ධයෙන් පාර්ශ්වයන්ගේ කරුණු දැක්වීම.**

1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ අංක 39 දරන නියෝගය යටතේ 1959 මාර්තු 02 වැනි දිනැති අංක 11688 දරන රජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 1969 කාර්මික ආරාවුල් පනත යටතේ වූ නියෝග සංග්‍රහයේ 21(1) දරන නියෝගයෙහි දැක්වෙන පරිදි මෙම ආරාවුලට හේතු වී ඇති කරුණු කාරණා පිළිබඳව පාර්ශ්වයන් වෙතින් සම්පූර්ණ විස්තර වාර්තා බේරුම්කරණය වෙත ලිඛිතව ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස දැනුම් දී සිටි හෙයින් පාර්ශ්වයන් විසින් එසේ ඉදිරිපත් කරන ලද කරුණු සාරාංශ කර පහත පරිදි දැක්විය හැකි ය.

**පළමු පාර්ශ්වයේ කරුණු දැක්වීම.**

* පළමු පාර්ශ්වය මුලින්ම සේවයට බැඳුනේ 1981.03.16 වන දින බවත්, 2018.10.31 වැනි දිනට විශ්‍රාම ගන්වන විට මුළු සේවා කාලය වසර 37ක් බව හා 2002 වසරේ සහකාර අධ්‍යක්ෂිකා (සංගීත) ධූරයට පත් වූ බව.

* එම තනතුර වසර 18 ක් එනම් විශ්‍රාම යන තෙක්ම සේවය කළත් නියමිත වැටුප් ලබා නොදුන් බව හා 2012.01.17 දින J M 1 වැටුප් කාණ්ඩයෙන් M M 1:1 වැටුප් කාණ්ඩයෙහි පිහිටුවීමට තීරණය කර ඇයගේ නියමිත වැටුප ගෙවීමට සංස්ථාව තීරණය කර තිබූ බව.

* එහෙත් එය ලබා නොදුන් බැවින් කම්කරු කොමසාරිස්වරයා වෙත පැමිණිලි කළ බව ඉන්පසුව පාලන අධිකාරිය විසින් 2018.11.15 දිනැති ලිපිය මගින් 2018 මැයි මස සිට මාස 05 1/2කට පමණක් හිඟ වැටුප් ගෙවීමට තීරණය කර තිබූ අතර ඒ M M 1:1 යටතේ කාණ්ඩ ගතකර වැටුප් සංශෝධනය කිරීමෙන් බව.

* එම සංශෝධනයට එකඟතාවය පළ කරමින් 2018.11.16 දිනැති ලිපියක් යවන ලද බවත්, එහිදී හිඟ වැටුප් හා හිමිකම් සහිතව විෂමතාවය නිවැරදි කළ යුතු බවට දැනුම් දුන් බවත්,

* සෑම තනතුරකම සේවයේ පිහිටුවීමේ දී නියමිත වැටුප ඉක්මවා තමා සිටියත් ඊළඟ ඉහල වැටුප් පියවරෙහි තමා පිහිටුවීමට ක්‍රියා නොකර තිබෙන බව.

* 2006.01.01 දිනට ක්‍රියාත්මක වන M M 1:1 වැටුප් කාණ්ඩයේ විෂමතාවය සංශෝධනය කිරීමේ දී හිඟ වැටුප් හා හිමිකම් ලබා නොදීම නිසා අසාධාරණයක් සිදුව තිබෙන බව හා පහත දැක්වෙන හිමිකම් ලැබිය යුතුව තිබෙන බව.

1. 2006.01.01 සිට 2018.10.31 දක්වා වසර 12කට හිඟ වැටුප්, හිඟ පාරිතෝෂික හා හිඟ අර්ථ සාධක අරමුදල් හා හිඟ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල්
2. වසර 16 ක සේවා කාලය සඳහා වාහන බලපත්‍රය
3. ප්‍රවාහන දීමනා
4. දුරකථන දීමනා
5. විධායක ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන විශේෂ දීමනා.

**දෙවන පාර්ශ්වයේ කරුණු දැක්වීම**

* පළමු පාර්ශ්වය 1982.04.01 දින සිට ස්ථිර කාර්ය මණ්ඩලයේ සම්පාදන නිලධාරිනි තනතුරට බඳවාගත් බව.

* ඉන් පසුව සංස්ථා මණ්ඩලයේ තීරණයක් මත 1993.06.01 දින සිට නිෂ්පාදක (සංගීත) තනතුරට ද 2001.06.01 දින සිට ජ්‍යෙෂ්ඨ විධායක තනතුරට ද, 2002.10.16 සිට සහකාර අධ්‍යක්ෂ (සංගීත) තනතුරට ද පත්කරන ලද බව.

* සහකාර අධ්‍යක්ෂ තනතුරෙහි සේවය කරමින් සිටිය දී 2018.10.31 දින සිට වයස සම්පූර්ණ වීම නිසා ඇය විශ්‍රාම ගන්වන ලද බවත්, එහිදී දුරකථන දීමනාව හැර ඇයට හිමි අනෙකුත් සියලුම ව්‍යවස්ථාපිත දීමනා නිසි ලෙස ගෙවන ලද බවත්.

* පළමු පාර්ශ්වය සහකාර අධ්‍යක්ෂ (සංගීත) තනතුරෙහි සේවය කරමින් සිටිය දී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අංක 30 දරන හා 2006.09.22 දිනැති චක්‍රලේඛනය නිකුත් කරන ලද බව.

* එම චක්‍රලේඛනයට අනුව ඇයට J M 1:1 වැටුප් කාණ්ඩය පියවර අංක 5 ට අදල වැටුප් ක්‍රමය රු. 21,790 - 32,515 (475 X 9 -645 X 10) හිමි වූ බවත්, ඒ අනුව 2006.01.01 දිනට රු. 22,859.50 නව වැටුප මත පිහිටු වන ලද බව.

* එමගින් අතෘප්තියට පත් පළමු පාර්ශ්වය හා සේවක කණ්ඩායමක් තමන් වෙත M M 1:1 වැටුප් කාණ්ඩය ලබාදෙන ලෙස ඉල්ලීමක් කළ බව.

* විවිධ ප්‍රායෝගික කරුණු මත ද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සංස්ථාව සම්බන්ධයෙන් අනුමත කළ සේවා සංයුතිය පිළිබඳව වෘත්තීය සමිති විරෝධතා හේතු කරගෙන ද ඉහත ඉල්ලීම නිරාකරණය කිරීමට නොහැකි වූ බව.

* මෙම ආරාවුල දිගටම පැවතීමත් පරිපාලනමය ගැටළු ඇති වීමත් නිසා සේවකයන් විසින් පාලනාධිකාරිය වෙත යොමුකළ වැටුප් විෂමතා හා අනෙකුත් ගැටළු විමර්ශනය කිරීම සඳහා විශ්‍රාමික පරිපාලන නිලධාරියෙකු පත්කළ බව හා ඔහුගේ වාර්තා අනුව සංස්ථා මණ්ඩලය අංක 2018/08 හා 2018.09.04 දිනැති රැස්වීම මත පැවති වැටුප් විෂමතා පිළිබඳව විසඳුම් ලබා දීමට තීරණය කරන ලද බව.

* දීර්ඝ කාලීනව නොවිසඳුනු වැටුප් විෂමතා පිළිබඳව විසඳුම් ලබාදීමේ දී සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සැළකිල්ලට ගනිමින් හිඟ වැටුප් ඉල්ලා නොසිටීමේ පදනම මත ඔවුන් විශ්‍රාමික පරිපාලන නිලධාරියා වෙත කරන ලද දැන්වීම මෙන්ම එකී නිලධාරිගේ වාර්තා අනුව දෙවන පාර්ශ්වය කටයුතු කළ බව.

* ඒ අනුව කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අංක D M S/E/4/37/4/233/1 - VOL- 1 හා 2013.10.25 දිනැති අනුමත සේවක සංයුතිය මත 2006.01.01 දින සිට නියමිත වැටුප් කාණ්ඩයේ හා අදල වැටුප් තලයේ පිහිටුවා එහෙත් හිඟ වැටුප් ගෙවීමකින් තොරව 2018.05.14 දින සිට අදල සියළුම නිලධාරින්ට වැටුප් ගෙවීමට අංක 2018/8 හා 2018.09.04 දිනැති සංස්ථා මණ්ඩල රැස්වීමේ දී තීරණය කළ බව.

* එම තීරණය අනුව සංශෝධිත වැටුප පිළිබඳව පළමු පාර්ශ්වය 2018.11.15 දිනැති ලිපියෙන් දැනුවත් කළ බවත්, එහිදී පළමු පාර්ශ්වය විසින් 2006 වර්ෂයේ සිට හිඟ වැටුප් ලබා ගැනීමට තමා දැනට පවරා පවත්වාගෙන යන පරීක්ෂණයට අගතියක් නොවන පරිදි එකී වැටුප් සංශෝධනයට එකඟතාවය පළකරන බවත් දක්වමින් අදළ මුදල් ලබා ගැනීමට පළමු පාර්ශ්වය කටයුතු කළ බව.

* පළමු පාර්ශ්වය ද, ඇතුළුව ඉල්ලීම් කළ සේවකයන් හිඟ වැටුප් ඉල්ලා නොසිටින බවට වැටුප් විෂමතා ගැටළුව නිරාකරණයට පත්කළ නිලධාරියා වෙත කරන ලද දැනුම්දීම මත පොදු තීරණයකට එළඹ ගැටළුව විසඳීමට දෙවන පාර්ශ්වය ක්‍රියාකළ විටදී පළමු පාර්ශ්වය කොන්දේසි සඳහන් කරමින් ප්‍රතිලාභ ද ලබා ඉන් අනතුරුව හිඟ වැටුප් ඉල්ලීම සාධාරණ හා යුක්ති සහගත නොවන බව.

* එම නිසා බේරුම්කරණය මගින් සහනයක් ලැබීමට කාර්මික ආරාවුලක් නොපවත්නා බව හා එවැනි ක්‍රියාවලියක් තුළින් සහනයක් ලැබීමට පළමු පාර්ශ්වයට හිමිකමක් නොපවත්නා බව.

* ඉහත දැක්වෙන පරිදි පාර්ශ්වයන්ගේ කරුණු දැක්වීමෙන් පසුව මෙම නඩුව විභාගයට ගැනීමට තීරණය කරන ලද අතර එහිදී විසඳිය යුතු ප්‍රශ්නය පිළිබඳව අවධානය යොමු කළෙමි.

**විසඳිය යුතු වූ ප්‍රශ්න :**

1. කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද අංක 30 දරන හා 2006.09.22 දිනැති චක්‍රලේඛය ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවට අදාල වන්නේ ද?

2. එසේ අදාල වන්නේ නම් එහි ඇතුළත් ප්‍රතිපාදනයන් කුමන ආකාරයෙන් සහකාර අධ්‍යක්ෂ තනතුර කෙරෙහි බලපෑම් ඇති කරන්නේ ද?

3. එකී චක්‍රලේඛනයට අනුව කිසියම් තනතුරක පවත්නා වැටුප් පරිමාණය සංශෝධනය කිරීමෙන් පසුව නව වැටුප් පරිමාණයක් හඳුන්වා දිය යුතු වූයේ ද?

4. එම නව වැටුප් පරිමාණය හඳුන්වා දීමේ දී එමඟින් නිලධාරියාට කිසියම් ආර්ථිකමය වාසි සහගත බවක් උද්ගත කරයි ද?

5. එසේ ආර්ථිකමය වාසියක් උද්ගත කරයි නම් එය පෙරදතමව ක්‍රියාත්මක වන්නක් වේ ද?

6. එම පෙරදතම වීම මත නිලධාරියාට ලැබෙන කිසියම් ආර්ථිකමය වාසි සහගත බවක් වේනම් ඔහුට එය බැහැර කළ හැකි ද?

7. එමෙන්ම යම් නිලධාරියෙක් ලබන්නා වූ ආර්ථිකමය වාසිය ඔහු වෙත ලබා නොදී වෙනත් අයෙකු වෙත එය වලකාලීමේ බලතල පැවරේද?

8. එවැනි තත්ත්වයක් තුළ පළමු පාර්ශ්වය වෙත යම් අසාධාරණයක් සිදුව තිබේද? තිබේ නම් ඒ සඳහා ලබාදිය හැකි සහනයන් කවරේද? යන්න වේ.

**සාක්ෂි විශ්ලේෂණය**

ඉහත සඳහන් පරිදි විසඳිය යුතුව තිබෙන ප්‍රශ්නයන්ට පිළිතුරු සැපයීම සඳහා ඒ ඒ පාර්ශ්වයන් විසින් ඉදිරිපත් කරනු ලබන වාචිකමය සාක්ෂි කෙරෙහි මෙන්ම ලේඛන සාක්ෂි කෙරෙහි ද ඉතා සුපරික්ෂාකාරි ලෙස අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය කාර්යක් වේ. එසේ හෙයින් මෙම නඩුව විභාග කිරීම සඳහා තීරණය කරන ලද අතර එයට තවත් හේතු සාධකයක් වූයේ පාර්ශ්වයන් අතර සමථයක් නොමැති බවට වූ එකඟතාවයද මුල්කර ගනිමිනි. නඩු විභාගය ආරම්භ කරමින් ප්‍රථමයෙන් වග උත්තරකාර පාර්ශ්වයට සාක්ෂි මෙහෙයවීම සඳහා අවස්ථාව ලබා දුන්නද, ඒ සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශ්වයේ නීතිඥ මහතා දැඩි විරෝධතාවයක් ඉදිරිපත් කර සිටියේය. ඔහුගේ මූලික තර්කය වූයේ කිසියම් සේවකයකු සිය හාම්පුතාට එරෙහිව චෝදනා කරන්නේ නම් එය සනාථ කිරීම සේවකයා විසින් කළ යුතුව තිබෙන බවයි.

මේ පිළිබඳව නිශ්චිත නඩු තීන්දු කිහිපයක්ම ගෙන හැර දක්වමින් දෙවන පාර්ශ්වයේ නීතිඥ මහතා දීර්ඝ වශයෙන් කරුණු දක්වන ලදී. පළමු පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා මේ පිළිබඳව කරුණු දැක්වීමෙන් වැළකී සිටියේය. එම නිසා මෙම විරෝධතාවය සම්බන්ධයෙන් බේරුම්කරණය විසින් කරුණු දක්වන ලද අතර වගඋත්තරකාර පාර්ශ්වය මෙන්ම පැමිණිලිකාර පාර්ශ්වයද එකී කරුණු පිළිගැනීම හේතුකරගෙන ප්‍රකාශිත පරිදිම නඩු විභාගය ආරම්භ කෙරිණ. බේරුම්කරණය වෙත ආරාවුලක් ඉදිරිපත් වීමෙන් අනතුරුව පාර්ශ්වයන් වෙතින් අවස්ථා දෙකකදී මූලික වශයෙන් ලිඛිතව තොරතුරු ලබාගැනීමක් සිදුකරනු ලබයි.

නඩු විභාගය සඳහාත් එහි ආරම්භක අවස්ථාව සඳහා මෙන්ම තීන්දුව සම්බන්ධයෙන් ද මෙම ලිඛිත තොරතුරු ඉතා වැදගත් වේ. මෙම නඩුව සම්බන්ධයෙන් ද මෙම තොරතුරු ඉදිරිපත් කිරීම ඒ ආකාරයෙන්ම සිදු වූ අතර එහි කිසියම් හෝ වෙනසක් වූයේ නම් ඒ වගඋත්තරකාර පාර්ශ්වය සිය තොරතුරු ඉදිරිපත් කිරීමේ දෙවන අවස්ථාව නොසලකා හරිමින් ප්‍රමාද කර තිබීම පමණි. ඒ කෙසේ වෙතත් ඉහත පරිදි අදළ පාර්ශ්වයන් විසින් ඉදිරිපත් කරනු ලබන ලිඛිත කරුණු මනාව පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව නඩු විභාග ආරම්භ කළ යුතුව තිබේ. ඒ අනුව දෙවන පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 04 වන ඡේදයේ v වන අනු වගන්තිය කෙරෙහි අවධානය යොමු කිරීමට සිදුවිය.

එහි දැක්වෙන්නේ සංස්ථා මණ්ඩලය විසින් 2018.09.04 දින පැවති අංක 2018/08 රැස්වීමේ දී දීර්ඝකාලීනව නොවිසඳුනු වැටුප් විෂමතා සම්බන්ධව විසඳුම් ලබාදීමට තීරණය කළ බවය. මෙවන් ප්‍රකාශයක් වගඋත්තරකාර පාර්ශ්වය විසින් සිය පළමු ප්‍රකාශයට ඇතුළත් කිරීමට හේතු වන්නේ පැමිණිලිකාරියගේ නැතහොත් පළමු පාර්ශ්වයේ පැමිණිල්ලට අදළ කරුණු ද ඊට අයත් වන බැවිනි. එපමණක්ද නොව එම ඡේදයේ ම VII වන අනු වගන්තියෙන් ප්‍රකාශ වන්නේ 2018.05.14 දින සිට අදළ සියලුම නිලධාරීන්ට වැටුප් ගෙවීමට 2018.09.14 දින පැවති අංක 2018/08 සංස්ථා මණ්ඩල රැස්වීමේදී තීරණය කරන ලද බවයි. තව ද 04 වන ඡේදයේ ම VIII අනු වගන්තියෙන් ප්‍රකාශ වී ඇත්තේ 2006 වර්ෂයේ සිට හිඟ වැටුප් ලබා ගැනීමට දැනට පවත්නා විෂමතාවය නිවැරදි කිරීමේ පරීක්ෂණයට අගතියක් නොවන පරිදි මෙම වැටුප් සංශෝධනයට එකඟතාවය පළකරමින් පැමිණිලිකාරිය අදළ මුදල ලබා ගැනීමට කටයුතු කර තිබෙන බවටය.

මින් පැහැදිලි වන්නේ මෙම ආරාවුලට අදළව පළමු පාර්ශ්වය හා දෙවන පාර්ශ්වය යම් යම් එකඟතාවයන්ට එළඹ සිටී බවත් ඒ නිසාම ආරාවුලේ ස්වභාවය පිළිබඳව දෙවන පාර්ශ්වය මෙ වන විටත් මනා වැටහීමක් ලබා තිබෙන. බවත් ය. එම තොරතුරු ප්‍රකාශයේම XI අනුවගන්තිය මඟින් ද දෙවන පාර්ශ්වය කරුණු දක්වමින් ප්‍රකාශ කරන්නේ පැමිණිලිකාරිය හිඟ වැටුප් ඉල්ලා සිටීම සාධාරණ හා යුක්ති සහගත නොවන බවටයි. මෙම සියලුම සාධකයන් මඟින් පැහැදිලි වන්නේ පාර්ශ්වයන් අතර උද්ගත ආරාවුල සම්බන්ධයෙන් ආයතනය තුළ දී යම් යම් එකඟතාවයන්ට මෙන්ම විරෝධතාවයන්ට ද මුහුණ දෙමින් සිටි ආකාරයයි. එහෙයින් බේරුම්කරණය ඉදිරියේ පළමු පාර්ශ්වය විසින් තම දුක්ගැනවිල්ල නැවත නැවත මුල සිට ගෙනහැර දැක්වීමේ අවශ්‍යතාවයන් උද්ගත වන්නේ නැත. එහි දී අවශ්‍ය වන්නේ දැනටමත් පාර්ශ්වයන් වටහා ගෙන තිබෙන ගැටළුකාරී පඛව සාධාරණ වූත් යුක්ති සහගත වූත් යම් තැනකට ගොනු කරවාලීමය.

එය විශේෂයෙන්ම නඩු විභාගයේ දී කාලය ඉතිරි කරවා ගැනීම සඳහා ද අතිශයින්ම අවශ්‍ය වන්නක් වේ. එම නිසා පළමුවන සාක්ෂි මෙහෙයවීම දෙවන පාර්ශ්වය හෙවත් වග උත්තරකාර පාර්ශ්වය වෙතම පැවරින. මේ හැරුන විට වගඋත්තරකාර පාර්ශ්වය මෙම නඩුවේ දී තවත් නීතිමය ප්‍රශ්නයක් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර සිටියේ පළමු පාර්ශ්වය මේ වන විට එනම් 2018.10.31 දින සිට විශ්‍රාම ගන්වා ඇති බැවන් එදින සිට පළමු පාර්ශ්වය හා දෙවන පාර්ශ්වය අතර සේවා ගිවිසුමක් නොපවත්නා බවත් ඒ අනුව බේරුම්කරණය යටතේ සහන ලැබීමට පළමු පාර්ශ්වයට නෛතිකව අයිතියක් නොපවතින බවත් ය. මෙම බේරුම්කරණය ස්ථාපිත කරුණු ලැබ ඇත්තේ 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියේ ප්‍රතිපාදනයක් අනුවය.

කාර්මික ආරාවුල් පනතේ 48 වගන්තිය අර්ථනිරූපනය වගන්තිය වන අතර එහි ''සේවකයා'' යන්න පහත සඳහන් පරිදි අර්ථ ගන්වා තිබේ. ''සේවකයා යන්නෙන් ප්‍රකාශිත ගිවිසුමක් වන හෝ ව්‍යවස්ථාපිත ගිවිසුමක් වන හෝ ලිඛිත හෝ විචාක ගිවිසුමක් වන හෝ සේවා ගිවිසුමක් හෝ ආධුනිකත්ව ගිවිසුමක් වන හෝ පුද්ගලිකවම යම් වැඩක් කිරීම නැතහොත් ශ්‍රමය යෙදීම සඳහා වූ ගිවිසුමක් වන හෝ යම් ගිවිසුමකින් බැඳී සිටින නැතහොත් එවැනි ගිවිසුමක් යටතේ වැඩ කරන යම් තැනැත්තෙකු අදහස් වන අතර යම් නිශ්චිත අවස්ථාවක දී සේවයේ යෙදී සිටිය ද නොසිටිය ද සාමාන්‍යයෙන් එවැනි යම් ගිවිසුමක් යටතේ සේවයේ යොදවනු ලැබූ යම් තැනැත්තෙකු ඊට ඇතුළත් වේ.

තව ද සේවය අවසන් කරනු ලැබූ ඇති යම් තැනැත්තෙකු ද ඊට ඇතුලත් වේ'' වගඋත්තරකාර පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද නීතිමය ප්‍රශ්නයට ඉතා පැහැදිලි පිළිතුරක් පනතේ අර්ථ නිරූපන වගන්තියේ ඇතුළත්ව පවතින බැවින් බේරුම්කරණය විසින් එකී විරෝධතාවය සම්බන්ධයෙන් තවදුරටත් කරුණු පැහැදිලි කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනඟින අතර ඒ අනුව ඉල්ලුම්කාරියට සහන ඉල්ලා බේරුම්කරණය වෙත අයදුම් කිරීමේ නෛතිකමය අයිතියක් පවත්නා බවට ද තීරණය කරමි.

වග උත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් මුලින්ම සාක්ෂියට කැඳවන ලද්දේ ගුවන් විදුලි සංස්ථාවේ සහකාර අධ්‍යක්ෂවරියකි. ඇය සාක්ෂි ලබා දෙමින් ප්‍රකාශ කර සිටියේ ගුවන් විදුලි සංස්ථාවේ ප්‍රධාන අදයම් මාර්ගය වන්නේ ගුවන් කාලය විකිණීම හා රජය විසින් ලබා දෙන ප්‍රදානයන් බවයි. මේ සම්බන්ධයෙන් පළමු පාර්ශ්වය කිසිදු අභියෝගයක් දෙවන පාර්ශ්වය වෙත නොකිරීමෙන් පෙනී ගියේ ඉහත ප්‍රකාශ පිළිගන්නා බවකි. එමෙන්ම සාක්ෂිකාරිය මෙහි දී වැඩිදුරටත් ප්‍රකාශ කර සිටියේ ආයතනයේ පරිපාලන කටයුතු මෙහෙයවීමේ දී රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින් විටින් විට නිකුත් කරනු ලබන චක්‍රලේඛ හා විධිවිධානයන් අනුගමනය කරන බව ය. එවැනි චක්‍රලේඛ සංස්ථා මණ්ඩලයේ තීරණය පරිදි ක්‍රියාවට නන්වන බව ද ඇය ප්‍රකාශ කර සිටියා ය.

පළමු පාර්ශවයේ ප්‍රධානතම ඉල්ලීම වන්නේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් 2006.09.22 දිනැතිව නිකුත් කරන ලද අංක 30/2006 දරන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කරන ලෙස ය. ඊට අනුරූපව දෙවන පාර්ශ්වය කටයුතු නොකිරීමෙන් මෙම ආරාවුල පාර්ශ්වයන් අතර උද්ගතව පවත්නා බව ද ඉතා පැහැදිලිය. ඒ කෙසේ වෙතත් මෙම චක්‍රලේඛය වගඋත්තරකාර ආයතනයට අදළ වන්නක් බව ඉහත සාක්ෂියේ දී දෙවන පාර්ශ්වය විසින් පිළිගෙන තිබීම මත විසඳිය යුතු ප්‍රශ්න අතරින් පළමු ප්‍රශ්නය නිරාකරණය කෙරේ. කිසියම් චක්‍රලේඛයක් ක්‍රියාත්මක කරණු ලබන්නේ සංස්ථා මණ්ඩලයේ තීරණයන් පරිදි බවට ද මෙම සාක්ෂියේ දී ප්‍රකාශ වූවත් එය පළමු පාර්ශ්වය විසින් හබ කිරීමට ලක් කර නැත.

එහෙත් මෙහි දී උද්ගත වන ප්‍රශ්නය වන්නේ යම් චක්‍රලේඛයක් ක්‍රියාත්මක කිරීමේ දී එහි අන්තර්ගතය යම් යම් වෙනස්කම් වලට භාජනය කරමින් අවශ්‍ය පරිදි ක්‍රියාත්මක කිරීමට සංස්ථාව බලතල හිමිව තිබේ ද යන්න ය. එසේ තිබිය නොහැකි ය. එවන් අවස්ථාවකදී එකී චක්‍රලේඛනයේ පොදු බව ගිලිහි යනවා පමණක් නොව එය යම් යම් විකෘති තත්ත්වයන්ට ද පත්වන එක වළක්වාලිය හැක්කක් නොවේ. සාක්ෂිකාරිය වැඩිදුරටත් සාක්ෂි ලබා දෙමින් ප්‍රකාශ කර සිටියේ පැමිණිලිකාරිය වර්ෂ 1982 අප්‍රේල් මස 01 වන දින ස්ථිර කාර්ය මණ්ඩලයේ සම්පාදක නිලධාරී තනතුරට පත්ව පසුව 1993 ජුනි 01 වන දින සිට නිෂ්පාදක (සංගීත) තනතුරට පත් වූ බවයි.

ඉන් ඉක්බිතිව වර්ෂ 2001 ජුනි මස 01 වන දින සිට ජ්‍යෙෂ්ඨ සංවිධායක තනතුරටත් වර්ෂ 2002 ඔක්තෝබර් මස 16 වැනි දින සහකාර අධ්‍යක්ෂ (සංගීත) තනතුරටත් පත්වූ බව ද හෙළිදරව් කරන ලදී. සාක්ෂිකාරිය විසින් මේ ආකාරයෙන් ඉදිරිපත් කරන ලද තනතුරු පිළිබඳව හෝ දිනවකවානු පිළිබඳව හෝ පළමු පාර්ශ්වය හබ කිරීමක් සිදු නොකිරීම තුළින් ඒවා පිළිගත් බව ද පැහැදිලි විය. පැමිණිලිකාරියගේ සාක්ෂියේ දී ඇය ප්‍රකාශ කර සිටියේ තමාගේ මුල් පත්වීමේ දිනය 1981 මාර්තු මස 16 වන දින බවටය. එහෙත් වගඋත්තරකාර පාර්ශ්වය සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ පැමිණිලිකාරියගේ මුල් පත්වීමේ දිනය පිළිබඳව නොව ඇයගේ ස්ථිර පත්වීමේ දිනය පිළිබඳව බැවින් පාර්ශ්වයන් අතර ඒ සම්බන්ධයෙන් ගැටළුකාරී තත්ත්වයක් උද්ගතවීමට හේතු නොවූ බව නිරීක්ෂණය කළෙමි.

වගඋත්තරකාර පාර්ශ්වය සාක්ෂි ලබා දෙමින් උද්ගතව පවතින කාර්මික ආරාවුල පිළිබඳව පහත පරිදි කරුණු දක්වා තිබේ.

(2019.11.14 දිනැති සාක්ෂි සටහන් හි 17 වන පිටුව)

ප්‍ර : මොකක් ද ඒ කාර්මික ආරාවුල කියලා කියන්න පුළුවන් ද?

උ : ඇයගේ නිත්‍ය තනතුර සහකාර අධ්‍යක්ෂ තනතුර වැටුප් කේතය විය යුත්තේ M M 1 : 1 වැටුප් කේතය යටතේ ඇයට වැටුප් ලැබිය යුතුයි. නමුත් J M 1 : 1 කියන වැටුප් කේතය යටතේ වැටුප් ගෙවීම සම්බන්ධයෙන් සහ දුරකතන දීමනා සහ විශේෂිත දීමනා ඇයට නොගෙවීම පිළිබඳවයි ඇය ගරු අධිකරණයට පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබෙන්නේ.

ඉහත දැක්වෙන ප්‍රකාශයෙන් පැහැලිදි වන්නේ පළමු පාර්ශ්වය සහ දෙවන පාර්ශ්වය අතර ආරාවුලක් හට ගැනීමට මුල් වී ඇත්තේ චක්‍රලේඛ අංක 30/2006 ට අනුකූලව කටයුතු නොකිරීම බව පෙනී යයි. අදළ සාක්ෂියේ දී සඳහන් කරන කේත ක්‍රමය හඳුන්වා දී ඇත්තේ මෙම චක්‍රලේඛය මගිනි. සාක්ෂිකාරිය වැඩිදුරටත් සාක්ෂි ලබා දෙමින් ප්‍රකාශ කර ඇත්තේ පැමිණිලිකාරිය වගඋත්තරකාර ආයතනය වෙත වාචිකව මෙන්ම ලිඛිතව ද තනතුරට අදළ වැටුප් තලය ලබා දෙන ලෙස ඉල්ලීම් කර තිබෙන බවයි.

පැමිණිලිකාරිය වර්ෂ 2001.06.01 දින ජ්‍යෙෂ්ඨ සංවිධායක තනතුරට පත්ව සිටින බවත් එම තනතුරට හිමි වැටුප් ක්‍රමය J M 1 : 1 කේතය යටතේ දැක්වෙන බවත් ඇය වර්ෂ 2002.10.16 දින සහකාර අධ්‍යක්ෂ (සංගීත) තනතුරට පත්වූ බවත් ඊට අදළ කේතය වන්නේ M M 1 : 1 කේතය බවත් සාක්ෂිකාරිය ප්‍රකාශ කළා ය. (2019.11.14 දිනැති සාක්ෂි සටහන් හි 21 පිටුව)

ප්‍ර : දැන් ඔබ ප්‍රකාශ කළානේ කේතය කියලා කතන්දරයක් ඒ මොකක් ද?

උ : කළමණාකරන සේවා දෙපාර්තමේනතුවේ චක්‍රලේඛය අනුව සේවක කණ්ඩායම් වර්ගීකරණයක් සිදු කළා.

ප්‍ර : කොයි කාලයේ ද?

උ : 2006 වර්ෂයේ දී.

ප්‍ර : ඇයි එහෙම වර්ගීකරණයක් සිදු කළේ කියලා කියන්න දන්නවාද?

උ : 2006.09.22 දිනය කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක 30 අනුව.

තව ද සාක්ෂිකාරිය මෙහි දී වැඩිදුරටත් සාක්ෂි ලබා දෙමින් ප්‍රකාශ කර සිටියේ ගුවන් විදුලි සංස්ථාව කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ ක්‍රියාත්මක කිරීමට බැඳී සිටින බවත් එම නිසාම අංක 30/2006 දරන චක්‍රලේඛය දෙවන පාර්ශ්වයේ සේවක සේවිකාවන්ට ද අදළ කෙරෙන්නක් බවත් ය.

නඩු විභාගයේ දී පාර්ශ්වයන් වෙතින් ඉදිරිපත් වූ සාක්ෂි විශ්ලේෂණය කර බැලීමේ දී අංක 30/2006 දරන චක්‍රලේඛය 2006.01.01 දින සිට ක්‍රියාත්මක විය යුතු එකක් බව පැහැදිලි වේ. එහෙත් දෙවන පාර්ශ්වය හෙවත් වගඋත්තරකාර පාර්ශ්වය එය එදින සිට ක්‍රියාත්මක නොකර වාර්ෂ 2018.05.14 දින සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු කර තිබේ. ඒ 2006.01.01 දින සිට 2018.05.13 දක්වා හිඟ වැටුප් ගෙවීමකින් තොරවය. වගඋත්තරකාර පාර්ශ්වය විසින් මේ සම්බන්ධයෙන් 2018 වර්ෂයේ දී විශ්‍රාමික පාරිපාලන නිලධාරියෙකු පත් කරමින් වැටුප් විෂමතා පිළිබඳව වාර්තාවක් සකස් කරවා ඇති අතර එම වාර්තාව සංස්ථා මණ්ඩලය විසින් පිළිගන්නා ලද බව ද ප්‍රකාශ වේ. මෙමගින් කරුණු දෙකක් හෙළිදරව් වේ. එනම්

1. කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු අංක 30/2006 දරන චක්‍රලේඛය වගඋත්තරකාර ආයතනයට අදළ වන බව හා

2. චක්‍රලේඛයෙහි අන්තර්ගත විධිවිධානයන්ට හා උපදෙස්වලට අනුකූලව කටයුතු කිරීමට වගඋත්තරකාර ආයතනය දක්වා නොතිබෙන බව යනාදි වශයෙනි.

   මෙම චක්‍රලේඛනය වගඋත්තරකාර පාර්ශ්වය විසින් වර්ෂ 2018.05.14 දින සිට ක්‍රියාත්මක කිරීම මගින් එය වගඋත්තරකාර ආයතනයට අදළ වන බව තහවුරු කෙරෙන අතර 2006.01.01 දින සිට ක්‍රියාත්මක වූවක් සේ නොසලකා හරිමින් අදළ සේවක සේවිකාවන්ට හිඟ වැටුප් ගෙවීමට කටයුතු නොකරමින් එකී චක්‍රලේඛ උපදෙස් ඒ ආකාරයෙන් පිළිපැදීමට කටයුතු නොකිරීමක් ලෙස නිරීක්ෂණය කරමි. එමෙන්ම විශ්‍රාමික නිලධාරියා විසින් සකස් කරන ලැදැයි කියන වාර්තාව නඩු විභාගය සඳහා වගඋත්තරකාර පාර්ශ්වය විසින් ආර් - 16 යටතේ ඉදිරිපත් කිරීමට කටයුතු කළ ද එහි අඩුපාඩු විය.

එහි 8 වන ඡේදයේ ඇතුළත් ආකාරයට යෝජනා ක්‍රියාත්මක වීමේ දිනය ආර් - 17 ලේඛනයේ අවසන් ඡේදයට පටහැනි ය. අවම වශයෙන් එකී නිලධාරියා සාක්ෂිකරුවෙකු ලෙස බේරුම්කරණය වෙත ඉදිරිපත් කළේ ද නැත. මෙම වාර්තාවට අනුව නියමිත සේවකයන් තමන්ට හිමි තනතුරුවල තමන් පිහිටුවන ලෙස හා හිඟ වැටුප් ගෙවීම අවශ්‍ය නොවන බවට එකඟ වූ බවක් ද විභාගයේ දී කරුණු දැක්වීමක් කළ ද එය සනාථ කිරීමට කිසිදු සාක්ෂියක් ද නොවීය. දෙවන පාර්ශ්වයේ මෙම ප්‍රකාශය සම්බන්ධයෙන් පළමු පාර්ශ්වයේ ස්ථාවර වූයේ තමන් හිඟ වැටුප් ලබා නොගැනීමට කිසිදු ආකාරයකින් එකඟතාවයකට පත් නොවූ බවය. පැමිණිලිකාරිය පමණක් හෝ එසේ එකඟතාවයට එළඹි බවට සාධක වගඋත්තරකාර පාර්ශ්වය සතු නොවූ බව ද පැහැදිලි විය.

(2019.11.14 දිනැති සාක්ෂි සටහන් හි පිටු අංක 35 සහ 36 ) බේරුම්කරුගේ ප්‍රශ්න කිරීම.

ප්‍ර : කිසියම් චක්‍රලේඛනයක් ලැබුණාම එම චක්‍රලේඛනය යම් කිසි වෙනසකට භාජනය කරන්න සංස්ථාවට බලතල තියෙනවා ද ?

උ : මම දන්නේ නැහැ

ප්‍ර : දැන් ඔය කළමණාකරණ සේවා අංක 30 චක්‍රලේඛය තමුන්ගේ අයතනයට අදළ ද?

උ : අදළයි.

ප්‍ර : දැන් තමුන් පිළිගත්තා පිමිණිලිකාරිය මධ්‍යම මට්ටමේ කළමණාකරණ සේවාවට (එම් එම් ) ඇතුළත් වෙනවා කියලා?

උ : ඇතුළත් වෙනවා

ප්‍ර : දැන් මේ අංක 30 දරන චක්‍රලේඛනය අනුව එහෙම නැතිනම් ආර් - 6 ලේඛනය අනුව ඇයට හිමිවිය යුතු වන්නේ M M 1 : 1 කියන වැටුප් පරිමාණය කියලා තමුන්ට අවබෝධයක් තියෙනවා ද?

උ : ඔව්.

ප්‍ර : ඒක තමන් පිළිගන්නවා ද?

උ : ඔව්.

ප්‍ර : එතකොට එහෙම තියෙද්දි තමන් ප්‍රකාශ කරන්නේ පැමිණිලිකාරිනියට J M 1 :1 ඒ කියන්නේ ජුනියර් මැනේජ්මන්ට් වැටුප් ක්‍රමය තමයි ලබා දුන්නේ කියලා ?

උ : ඔව්

මේ අනුව කළමණාකරණ සේවා චක්‍රලේඛ 30/2006 මඟින් ඒ වන විට සහකාර අධ්‍යක්ෂ ධූරයක් දරමින් සිටි පැමිණිලිකාරියට යම් යම් වාසි සහගත තත්වයක් ඇති වී තිබෙන බව වගඋත්තරකාර පාර්ශ්වයේ සාක්ෂි මඟින් ම තහවුරු කෙරෙන බව පෙනී යයි. තවද අදාළ චක්‍රලේඛයට අනුව ඒ ඒ නිලධාරීන් අදාළ තනතුරුවල පිහිටුවා ඔවුන්ට හිමි වැටුප් ගෙවීමේ අවශ්‍යතාවයක් නොමැති බවට එකී නිලධාරින් හා වෘත්තිය සමිති එකඟ වූ බවට ලිඛිත සාධක කිසිවක් නඩු විභාගයේ දී ඉදිරිපත් වූයේ නැත. ඒ හැරුණු කොට පැමිණිලිකාරිය මේ සම්බන්ධයෙන් සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ පැ-එක්ස් (1) ලේඛනයේ පරිදි එකී වැටුප් විෂමතාවය නිවැරදි කළ යුත්තේ තමන් විසින් කම්කරු කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කර ඇති පැමිණිල්ලට අදළ පරීක්ෂණයට අගතියක් නොවන පරිදි වන බවට දැනුම් දෙමින් තමන් ඉදිරිපත් කරන් ලද ලිපිය පැ-එක්ස් (8) වශයෙන් සලකුණු කර තිබෙන බවයි. මෙමඟින් ද පැහැදිලි වන්නේ පැමිණිලිකාරිය වැටුප් විෂමතා පිළිබඳව වූ හිඟ වැටුප ලබා ගැනීම ප්‍රතික්ෂේප කිරීමේ තීරණයක රැඳී නොසිටි බවය. එමෙන්ම වගඋත්තරකාර පාර්ශ්වය වැටුප් විෂමතාවය සම්බන්ධයෙන් විසඳුම් ලබාදීමට අදළව සාක්ෂි 2020.02.12 දිනැති සාක්ෂි සටහන්හි ඇතුළත්ව ඇත.

ඒ සම්බන්ධයෙන් වූ ලිඛිත සාධකයන් ද විචාරශීලීව සලකා බලන විට අංක 30/2006 චක්‍රලේඛනයට අනුව පැමිණිලිකාරියගේ තනතුරට අදාළව පැවති වැටුප් පරිමාණය ද සංශෝධනයට ලක්ව තිබෙන බවත් එහි දී ඒ සඳහා නව වැටුප් පරිමාණයක් හඳුන්වා දී තිබුණ බවත් ඒ නව වැටුප් පරිමාණය හඳුන්වා දීම හේතු කර ගෙන එමගින් පැමිණිලිකාරියට ආර්ථිකමය වාසි සහගත බවක් උද්ගතව පවත්නා බවත් ඉතා පැහැදිලි ය. (2020.02.12 දිනැති සාක්ෂි සටහන් හි 26 පිටුව) වගඋත්තරකාර පාර්ශ්වයේ සාක්ෂි

ප්‍ර : ආර් - 19 මොකක් ද සිදු වුණේ ?

උ : J M 1:1 V පියවරේ වැටුප් ලබමින් සිටි ඇය M M 1 : 1 වැටුප් කේතයට අන්තර්ග්‍රහනය කිරීම සිදු කළා.

ප්‍ර : ඒක ඇය වෙත දැනුම් දුන්නා ද ?

උ : ආර් - 19 ලිපිය මගින් දැනුම් දුන්නා.

ප්‍ර : ආර් - 19 ලිපිය පිළිගත්තා ද මේ ඉල්ලුම්කාරිය ?

උ : ඇය ඒ ලිපිය පිළිගත්තා. හැබැයි කොන්දේසියකට යටත්ව.

ප්‍ර : කොහොම ද දැන ගත්තේ වැටුප් පිළිගත්තේ කොන්දේසියකට යටත්ව කියලා ?

උ : ඇය ලිඛිතව ඉදිරිපත් කළා.

(එම ලිපිය වගඋත්තරකාර පාර්ශ්වය විසින් ආර් - 20 (ඒ) ලෙස ද පැමිණිලිකාර පාර්ශවය විසින් පැ-එක්ස් (8) වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.)

තව ද පැමිණිලිකාරියගේ සාක්ෂි මගින් ද ඉහත තත්ත්වය තවදුරටත් තහවුරු කෙරෙන බවක් පෙනී යයි. එසේ පැමිණිලිකාරියට කිසියම් ආර්ථිකමය වාසිදායක බවක් උද්ගත කරන්නේ නම් එය පෙරදාතමව ක්‍රියාත්මක වන්නක් වේද යන්නත් සොයා බැලිය යුතුව තිබේ. මේ සඳහා පැමිණිලිකාරියගේ සාක්ෂිය ඉතා වැදගත් වේ. ( 2022.10.09 සාක්ෂි සටහනේ 4 සහ 5 පිටු) පැමිණිලිකාරියගේ මූලික සාක්ෂි

ප්‍ර : 2006.01.01 දිනැතිව ක්‍රියත්මකවන පරිදි M M 1 : 1 වැටුප් පරිමාණය හිමිකමක් තියෙනවා ද ?

උ : ඔව්.

ප්‍ර : කළමනාකරණ සේවා චක්‍රලේඛ 30/2006 අනුව ද ?

උ : ආර් - ඔව්.

ප්‍ර : තමා කවදා හෝ මේ හිඟ වැටුප, උසස් වීම් එපා කියලා ලිඛිතව වගඋත්තරකාර පාර්ශ්වයට හෝ දැනුම් දීලා තමන්ගේ හිමිකම් ඇතහැරලා තියෙනවා ද ?

උ : නැහැ. මගේ හිඟ වැටුප් සහ සියලු හිමිකම් දීමනා මට අවශ්‍යයි කියලා මම ලිපියක් ඉදිරිපත් කළා.

පැමිණිලිකාරියගේ ඉහත සාක්ෂියෙන් පැහැදිලි වන්නේ ඇය J M 1:1 වැටුප් කේතයේ සිට M M 1 : 1 වැටුප් කේතව පරිමාණයට හිමිකම් ලබන බවත් ඒ අංක 30/2006 දරන චක්‍රලේඛය පදනම් කර ගෙන බවත් M M 1 : 1 වැටුප් කේතයට අදාළ වැටුප් පරිමාණය 2006.01.01 සිට ක්‍රියාත්මක විය යුතු බවත් ය. එහෙත් පැමිණිලිකාරියට M M 1 : 1 කේතය යටතේ හිමි වැටුප ගෙවීමට කටයුතු කර ඇත්තේ 2018.05.14 දින සිටය. එසේ නම් පැමිණිලිකාරියට එම හිමිකම 2006.01.01 දින දක්වා පෙරදාතම විය යුතුව තිබේ.

(2022.10.19 දිනැති සාක්ෂි සටහන් හි 19 පිටුව)

ප්‍ර : 2018.05.14 දින සිට තමන් ඉල්ලා සිටි වැටුප් ක්‍රමය අනුව තමන්ට වැටුප් ගෙව්වා කියන එක පිළිගන්නවා ද ?

උ : ඔව්.

ප්‍ර : දැන් තමන් ඉල්ලන්නේ 2006.01.01 දින සිට 20018.05.13 දින දක්වා හිඟ වැටුප ද ?

උ : ඔව්.

ප්‍ර : කළමනාකරණ සේවා චක්‍රලේඛ 30/2006 අනුව තමන්ට 2006.01.01 දින සිට ක්‍රියාත්මකවන පරිදි තමාට වැටුප් තල වල පිහිටුවා වැටුප් ගෙව්වා ද ?

උ : නැහැ.

ප්‍ර : කළමනාකරණ සේවා චක්‍රලේඛ 30/2006 අනුව අදාළ වැටුප් තමන්ට ගෙවන්න පටන් ගත්තේ කවදා සිට ද ?

උ : 2018.05.14 දින සිට.

ඉල්ලුම්කාර පාර්ශවයේ සාක්ෂිවලින් මෙන්ම වගඋත්තරකාර පාර්ශවයේ සාක්ෂිවලින් ද අවිවාදිතව පිළිගැනෙන තවත් කරුණක් වන්නේ ඉල්ලුම්කාරිය 2018.10.31 වැනි දින සිට විශ්‍රාම ගන්වා තිබෙන බවත් ඇයට M M 1 : 1 කේතය යටතේ හිමිවිය යුතු වැටුප 2018.05.14 දින සිට ඇය විශ්‍රාම ගන්වන ලද දින දක්වා පමණක් කළමනාකරණ සේවා චක්‍රලේඛ 30/2006ට අනුකූලව වැටුප ගෙවීම් කර තිබෙන බවත් ය. එය නඩු විභාගයේ දී ඉදිරිපත් වූ වගඋත්තරකාර පාර්ශ්වය විසින් ආර්-22(ඒ) වශයෙන් සළකුණු කරන ලද ලේඛනය අනුව පැහැදිලි වන්නේ ඉල්ලුම්කාරියට 2018.05.14 දින සිට 2018.10.31 දින දක්වා එනම් ඇය විශ්‍රාම ගන්වන ලද දින දක්වා වූ කාලයට පමණක් වැටුප් සංශෝධනයට අනුව හිමි මූලික වැටුපෙහි හිඟ මුදල මෙන්ම එකී කාලයට අදාළව වෘත්තිය දීමනා හිඟ මුදල් ද ගෙවා තිබෙන බව ය. මෙමඟින් ඉතා වැදගත් වූ කරුණු දෙකක් හෙළිදරව් වන බව නිරීක්ෂණය කරමි. එනම්,

1. කළමණාකරණ සේවා චක්‍රලේඛ 30/2006 හා ඒ හා බැඳුණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 වගඋත්තරකාර ආයතනයට අදාළවන බව මෙන්ම ඉල්ලුම්කාරිය M M 1 : 1 වැටුප් කේතය යටතේ දැක්වෙන වැටුප් තලයේ වැටුප් ලැබීමට හිමිකම ලබන බව වගඋත්තරකාර ආයතනය පිළිගෙන තිබෙන බව.

2. ඉහත සඳහන් චක්‍රලේඛය ප්‍රකාරව M M 1 : 1 වැටුප් කේතයට අදාළ වැටුප ඉල්ලුම්කාරියට 2006.01.01 දින සිට ක්‍රියාත්මකවන පරිදි ගෙවිය යුතු වුවත් වගඋත්තරකාර පාර්ශ්වය එය නොසලකා හරිමින් 2018.05.14 දින සිට ක්‍රියාත්මකවන පරිදි ඇයට වැටුප් ගෙවා තිබෙන බව යනුවෙනි.

සේවක වැටුප් ප්‍රතිශෝධන චක්‍රලේඛනයේ උපදෙස් පරිදි ඒ ඒ කේතයන් සටහන් වූ වැටුප් පරිමණයට 2006.01.01 දිනට හෝ ඊට ප්‍රථම අවශ්‍ය සුදුසුකම් සපුරා ඇත්තේ නම් ඔවුන්ට 2006.01.01 දින සිට ක්‍රියාත්මකවන පරිදි නියමිත වැටුප් තලයන්හි පිහිටුවා වැටුප ගෙවිය යුතුව තිබුණි. විනිශ්චයට ලක්ව තිබෙන ආරාවුල අනුව සලකා බලන විට ඉල්ලුම්කාරිය ඒ වන විටත් දරමින් සිටි සහකාර අධ්‍යක්ෂ තනතුර අයත් වන්නේ M M 1 : 1 දරන කේතය යටතේ වූ වැටුප් පරිමාණයට බව පෙනී යයි. ඇය සහකාර අධ්‍යක්ෂ ධූරයට මුලින්ම පත්ව ඇත්තේ වර්ෂ 2002.10.16 දින දී වුවත් ඔවුන් කළමණාකරණ සේවා චක්‍රලේඛ 30/2006 හා 6/2006 චක්‍රලේඛ ප්‍රකාරව ඇයට 2006.01.01 දිනට පෙර කාලය සඳහා M M 1 : 1 වැටුප් කේතය සටහන් වූ වැටුපට හිමිකම් කිව නොහැකි ය. මන් ද යත් චක්‍රලේඛනය ක්‍රියාත්මක විය යුතු වන්නේ 2006.01.01 දින සිට බවට එහි පැහැදිලිව උපදෙස් ලබා දී තිබීම හේතුවෙනි. පවත්නා තත්ත්වය එය නම් වගඋත්තරකාර පාර්ශ්වය අදාළ යෝජනා 2018.05.14 දින සිට ක්‍රියාත්මක කරන ලද්දේ කුමන පදනමකින් ද යන්න නඩු විභාගයේ දී කිසිදු ආකාරයකින් එනම් සාධක සහිතව හෙළිදරව් කළේ නැත. අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත එය එදින සිට ක්‍රියාත්මක කළ බව ප්‍රකාශ වුවත් කිසියම් චක්‍රලේඛ උපදෙසක් එක් එක් ආයතනයට අවශ්‍ය පරිදි වෙනස් කරමින් ක්‍රියාත්මක කිරීමට බලතල පවරා දී තිබිය නොහැකි ය. එයට හේතුව වන්නේ චක්‍රලේඛයක් අදාළ ආයතනයන්ට පොදුවේ

බලපාන්නක් විය යුතු බැවිනි. ඒ හැරුණු විට චක්‍රලේඛයට අනුව හිඟ වැටුප් ගෙවීමට සිදු වන බැවින් එම මුදල සපයා ගැනීමේ දුෂ්කරතාවය හේතු කරගෙන ඊට සුදුසු වූ පිළියම් සෙවීමට සංස්ථා මණ්ඩල උපදේශක ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරියෙකු පත් කර වාර්තාවක් ලබා ගන්නා ලද බවට ද නඩු විභාගයේ දී වගඋත්තරකාර ආයතනය කරුණු හෙළිදරව් කර සිටියේ ය. එහි දී වැටුප් සංශෝධනය අදාළවන නිලධාරීන් හිඟ වැටුප් රහිතව නියමිත තනතුර පමණක් ලබා ගැනීමට කැමැත්ත පළ කරන ලද බවට ද තර්ක කරන ලදී.

එහෙත් ඒ බව තහවුරු කිරීම සඳහා වගඋත්තරකාර පාර්ශ්වය සාධක ඉදිරිපත් කිරීමට අපොහොසත් විය. මේ සම්බන්ධයෙන් ඉල්ලුම්කාර පාර්ශ්වය දිගින් දිගටම කරුණු දක්වා සිටියේ තමන් හිඟ වැටුප් ප්‍රතික්ෂේප කිරීමක් නොකළ බවටය. එය තහවුරු කරනු වස් පැමිණිල්ල පැ- X(8) දරන ලේඛනය ඉදිරිපත් කර තිබේ. සමස්ථයක් වශයෙන් ගත් කළ පැමිණිල්ල විසින් ඉදිරිපත් කරනු ලැබූ ප්‍රමුඛතම කරුණු කිසිවක් වග උත්තරකාර පාර්ශ්වය අභියෝගයකට ලක් කරමින් ඒවා බිඳ හෙලුවේ ද නැත.

ප්‍රදානය ෘ

මේ අනුව බලන විට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 යටතේ සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා M M 1:1 වැටුප් කේතය යටතේ වැටුප ඉල්ලුම්කාරිය වෙත හිමිවිය යුතුව තිබෙන බවත් එමගින් ඇය එතෙක් ලබමින් සිටි වැටුප් පරිමාණය කිසියම් වූ සංශෝධනයකට ලක්වන බවත් ඒ හේතු කරගෙන ඉල්ලුම්කාරියට 2006.01.01 දින සිට M M 1:1 වැටුප පදනම් කර ගනිමින් ආර්ථිකමය වාසි සහගත බවක් උද්ගත වන බවත් එම වැටුප් සංශෝධනය චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාත්මක විය යුතුව තිබෙන බැවින් එය 2006.01.01 දින දක්වා පෙරදාතම විය යුතු බවත් ඒ ආකාරයෙන් ලබන ආර්ථිකමය වාසිය පාලන අධිකාරියට හෝ වෙනත් නිලධාරියෙකුට වළකාලීමේ බලතල පැවරීමක් සිදු කර නොමැති බවත් එමෙන්ම එකී ආර්ථිකමය වාසිය ලබන නිලධාරියාට අවශ්‍ය නම් පමණක් ලිඛිත ප්‍රකාශයක් මඟින් තම හිඟ වැටුප් ප්‍රතික්ෂේප කරමින් තනතුරු නාමය පමණක් ලබා දෙන ලෙස වගකීමෙන් යුතුව පාලනධිකාරිය දැනුවත් කිරීමේ හැකියාව පවත්නා බවත් ඒ මත පිහිටා යම් කිසි වූ සුදුසු තීරණයක් ගැනීම පාලනධිකාරියේ වගකීම බවත් ඉදිරිපත් සාක්ෂිමත ඉතා පැහැදිලිය. එම නිසා කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30/2006 අනුව 2006.01.01 දින සිට ක්‍රියාත්මකවන පරිදි M M 1:1 වැටුප් පරිමාණයේ කාණ්ඩගත කර එකී වැටුප ඊට අදාළ පසු වේතන ද 2018.05.13 දක්වා වූ කාලයට ඉල්ලුම්කාරියට හිමි විය යුතු බවට තීරණය කරමි. ඒ අනුව ඉල්ලුම්කාරියගේ හිඟ වේතන ගණනය කිරීමේ දී ඉතා වැදගත් ලිඛිත සාධකයක් වන්නේ නඩු විභාගයේ දී වගඋත්තරකාර පාර්ශ්වය විසින් සලකුණු කරන ලද ආර්-19 දරන ලේඛනයයි. ඒ සම්බන්ධයෙන් ඉල්ලුම්කාර පාර්ශ්වය කිසිදු හබ කිරීමක් සිදු කර නොමැති අතර මෙම නඩු විභාගයේ දීම ඉල්ලුම්කාර පාර්ශ්වය ද පැ. X 13(2) D දරන ලේඛනයක් සලකුණු කර ඇත. මෙම ලේඛනයෙහි ඇතුළත් කරුණු හා ආර්- 19 දරන ලේඛනයේ ඇතුළත් කරුණු විශේෂයෙන් 2006.01.01 දින සිට 2018.11.01 දක්වා වූ සංඛ්‍යාතයන් සමාන බවක් ගනී. එම නිසා හිඟ වේතන ගණනය කිරීමේ දී මෙම ලේඛන කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීමට ද තීරණය කරමි.

තව ද, ඉල්ලුම්කාරිය විසින් තමන්ට 2006.01.01 දින සිට හිමිවිය යුතු ප්‍රවාහන දීමනාව ද දුරකතන දීමනාව ද විධායක ශ්‍රේණියේ නිලධාරීන් සඳහාවන විශේෂ දීමනාව ද ඉල්ලා ඇත. නඩු විභාගයේ දී වගඋත්තරකාර පාර්ශ්වය විසින් සලකුණු කරන ලද ආර් - 22 ඒ දරන ලේඛනය අනුව ඉල්ලුම්කාරිය වෙත 2018.05.14 දින සිට 2018.10.31 දින දක්වා ඇයට හිමි හිඟ මූලික වැටුප ද විශේෂ දීමනාව ද ගෙවීමට කටයුතු කර තිබෙන බව පෙනී යන අතර ඒ සම්බන්ධයෙන් පැමිණිලිකාර පාර්ශ්වය ද පැ - 01 ලේඛනය සළකුණු කරමින් ඊට එකඟ වූවා මිස හබ කිරීමක් කර නැත. ඒ කෙසේ වුවද විශේෂ දීමනාව ඉල්ලුම්කාරිය වෙත ගෙවා තිබීමෙන් එය ඇයට හිමි විය යුතුව තිබෙන බව වග උත්තරකාර පාර්ශ්වය ද පිළිගෙන තිබෙන බව ද පෙනී යයි. එහෙත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2015 හා 2015.06.26 දිනැති ලිපිය අනුව මෙම දීමනාව 2015.07.01 දින සිට ගෙවීමට නියම කර ඇති බැවින් ඉල්ලුම්කාරිනියට 2006.01.01 දින සිට 2018.05.13 දින දක්වා වූ කාලයට විධායක ශ්‍රේණියේ නිලධාරීන් සඳහාවන විශේෂ දීමනාව හිමි විය යුතු බවට තීරණය කරමි. 2018.05.14 සිට 2018.10.31 කාල පරිච්ඡේදයට ප්‍රවාහන දීමනාව හා දුරකතන දීමනාව ගෙවීම පිළිබඳව දෙපාර්ශ්වයම නිශ්ශබ්දතාවය ආරක්ෂා කළ බවත් පැහැදිලි වේ. එම නිසා ඉල්ලුම්කාරියට එම දීමනාවන් හිමිවිය යුතු ද යන්න පිළිබඳව සාධක සහිතව කරුණු පරීක්ෂා කර බැලිය යුතුව තිබේ. ඉල්ලුම්කාර පාර්ශ්වය තමන්ට හිමි වුවත් ලබා නොදුන් දුරකතන දීමනාව වශයෙන් මසකට රු.2,500.00 බැගින් මාස 154 සඳහා රු.385,000.00 ක් ලබා දෙන ලෙස ඉල්ලා සිටී. මේ සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශ්වය නඩු විභාගයේදී ආර් - 23 දරන ලේඛනය සලකුණු කර ඇත. එම ලේඛනයෙන් සන්නිවේදන දීමනාව හිමිවිය යුතු ආකාරය රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 02/2015 අනුව සිදු කළ යුතුව තිබෙන බව අවධාරණය කර ඇත. ඒ අධ්‍යක්ෂ ( පිරිස් ) විසින් නීති නිලධාරිනිය වෙත යොමු කරන ලද හා 2019.09.11 දිනැති ලිපිය මගිනි. එම ආර් - 23 දරන ලේඛනය ඔප්පු කිරීමේ භාරයට යටත් කරන ලෙස පැමිණිලි පාර්ශ්වය ඉල්ලා ඇතත් එම ලිපිය රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයක් මත පදනම් වූවක් බැවින් හා චක්‍රලේඛයක් ප්‍රසිද්ධ ලේඛනයක් බැවින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී. ඒ කෙසේ වෙතත් එම ලිපියට අනුව පැමිණිලිකාරිනියට සන්නිවේදන දීමනාව හිමිවීමට නම් ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගත යුතුව තිබිණි. වගඋත්තරකාර පාර්ශ්වය ප්‍රකාශ කරන්නේ

ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත්තේ 2018.09.18 දින සිට ක්‍රියාත්මකවන පරිදිය. මේ සම්බන්ධයෙන් පැමිණිලිකාර පාර්ශ්වය නඩු විභාගයේ දී පිළිගත හැකි සාධක ඉදිරිපත් කරමින් එය බිඳ හෙළීමට සමත් වූ බවක් නොපෙනේ. එම නිසා ඉල්ලුම්කාරියට සන්නිවේදන දීමනාව 2018.09.18 දින සිට ඇය විශ්‍රාම ගන්වන ලද දිනය වන 2018.10.31 දින දක්වා වූ කාලයට පමණක් හිමි විය යුතු බවට තීරණය කරමි. මෙම දුරකතන දීමනාවේ මාසික ගෙවීම් ප්‍රමාණය පිළිබඳව පාර්ශ්වයන් විසින් ඉදිරිපත් කරන ලද සාධක සලකා බලන විට එකිනෙකට වෙනස් වූ තත්ත්වයක් දැකිය හැකි ය. පළමු පාර්ශ්වය විසින් 2023 ක් වූ ජනවාරි මස 31 දිනැතිව ඉදිරිපත් කරන ලද ලිඛිත සැලකිරීම අනුව එය මාසිකව රු. 2,500.00 ක මුදලකි. වගඋත්තරකාර පාර්ශ්වය හෙවත් දෙවන පාර්ශ්වය නඩු විභාගයේ දී සළකුණු කරන ලද ආර් - 23 ලේඛනයේ 04 වන ඡේදය අනුව අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද අනෙකුත් විධායක මට්ටමේ නිලධාරීන් සඳහා එය රු. 5,000.00ක් බව දැක්වේ. ඉල්ලුම්කාර පාර්ශ්වයක් නොඉල්ලන ලද සහනයක් ලබාදීමට හෝ ඉල්ලන ලද ප්‍රමාණය ඉක්මවා සහන ලබා දීමට හෝ බේරුම්කරණය වෙත බලතල හිමි වී නැත. එහෙත් වගඋත්තරකාර පාර්ශ්වය ආර් - 23 වශයෙන් සළකුණු කරන ලද ලේඛනය රාජකාරිමය ලියවිල්ලක් වන බැවින් හා එය රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයක් පදනම් කර ගනිමින් සකසන ලද ලිපියක් බැවින් ඉල්ලුම්කාරිනියගේ ඉල්ලීම නොසලකා හරිමින් ආර් - 23 ලේඛනය මත පදනම්ව දුරකතන දීමනාව මසකට රු. 5,000.00 බැගින් ගෙන ගණනය කිරීමට ද තීරණය කරමි. පළමු පාර්ශ්වයේ තවත් එක ඉල්ලීමක් වන්නේ ප්‍රවාහන දීමනාවයි. මසකට රු. 10,000.00 බැගින් වන සේ වර්ෂ 2006 ජනවාරි මස සිට එය තමන්ට හිමි විය යුතු බව ඉල්ලුම්කාරිය සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත.

(2022.10.19 දිනැති සාක්ෂි සටහනෙහි 7 පිටුව)

ප්‍ර : M M 1:1 වැටුප් තලයට අනුව 2006.01.01 දින සිට තමාට රු.10,000.00 ක ප්‍රවාහන දීමනාවක් ලැබෙන්න ඕන ද?

පි : සංස්ථාවේ වසර 38 ක සේවා කාලයක් සම්පූර්ණ කරන මා හට බොහෝ අත්දැකීම් තියෙනවා. සංස්ථාවේ ප්‍රවාහන වියදම් අවශ්‍ය කෙනාට ලබා දුන්නා ද නැද්ද කියලා ප්‍රශ්නයක් තියෙනවා. මටත් ඒ ප්‍රවාහනයේ යාමේ අවසරය තිබෙන්න ඕනේ. නැත්නම් ඊට ගෙවන මුදල මා හට ලැබිය යුතුව තිබුණා.

ප්‍ර : එම ප්‍රවාහන දීමනාවන් 2006.01.01 දින සිට තමාට ලැබෙන්න ඕනේ කියලා තමයි තමා කියන්නේ?

පි : ඔව් කාලයත් සමඟ මුදලේ වටිනාකම වෙනස් වන බැවින් 2006.01.01 දින සිට ප්‍රවාහන සඳහා මුදලක් මට හිමි කියලා ඉල්ලුම්කාරිය නඩු විභාගයේ දී ඉදිරිපත් කර ඇති ඉහත ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ ඇය ඉල්ලා සිටින ප්‍රවාහන දීමනාව තමන්ට හිමි විය යුතු ආකාරය දැක්වෙන නෛතික තත්ත්වය පිළිබඳ ඇයට පැහැදිලි වැටහීමක් නොමැති බවයි. හුදෙක් එය ඇයගේ යම් අපේක්ෂා සහගත බවක් පමණි.

එමගින් වග උත්තරකාර ආයතනය විසින් තම සේවකයින්ට යම් ප්‍රවාහන දීමනාවක් ගෙවනු ලැබුවේ ද එසේ නොවේ නම් එය කුමන පදනමක් මත සිදු කරනු ලැබුවේ ද? ඒ සඳහා වූ නෛතික තත්ත්වය කුමක් වී ද යන්න පිළිබඳව අවධානය යොමු කළ යුතුව තිබේ. මේ සම්බන්ධයෙන් වැදගත් වන්නේ වගඋත්තරකාර පාර්ශ්වය විසින් සලකුණු කරන ලද ආර් -23 දරන ලේඛනයේ තෙවන ඡේදයයි.

මෙම ලේඛනය වගඋත්තරකාර ආයතනයේ අභ්‍යන්තරිකව හුවමාරු වූ රාජකාරිමය ලිපියකි. එම ලිපියට ද පදනම් වී ඇත්තේ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 1/2015 දරන ලේඛනය වේ. එමගින් ප්‍රකාශවන ආකාරයට ප්‍රවාහන දීමනාව හිමි වන්නේ H M 1:1 වැටුප් කාණ්ඩයේ හෝ ඊට ඉහළ වැටුප් කාණ්ඩයන් යටතේ වැටුප් ලබන නිලධාරීන්ට පමණි. මෙම නඩුවට අදාළ ඉල්ලුම්කාරිය සහකාර අධ්‍යක්ෂවරියක ලෙස සේවය කර ඇති අතර ඇය අයත් වූ වැටුප් කාණ්ඩය වුයේ M M 1:1 වැටුප් කාණ්ඩයයි. එය H M 1:1 වැටුප් කාණ්ඩයට පහළ මට්ටමේ පැවති වැටුප් ක්ෂේත්‍රයකි.

මෙම තත්ත්වයට එරෙහිව ඉල්ලුම්කාරිය නඩු විභාගයේ දී කිසිදු සාධක සහිත ස්ථාවරයන් ඉදිරිපත් කිරීමක් ද සිදු කර නොමැති අතර ඒ සම්බන්ධයෙන් හබ කිරීමක් ද සිදු කර නැත. එම නිසා ඉල්ලුම්කාරියට ප්‍රවාහන දීමනාව හිමි නොවන බවට තීරණය කරමි.

මෙයට අමතරව ඉල්ලුම්කාරිය නඩු විභාගයේ දී සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ තමාට සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍ර ලැබීමේ හිමිකම් පැවතියත් වගඋත්තරකාර ආයතනය එය ලබාදීමට කටයුතු නොකළ බවයි.

(2022.10.19 දිනැති සාක්ෂි සටහනෙහි 05 හා 06 පිටු)

ප්‍රඃ M M 1:1 වැටුප් තලයට ඒ කාලයට වාහන බලපත්‍ර එකක් ද නැති නම් දෙකක් ද ලැබෙන්න ඕන?

පිඃ මම සහකාර අධ්‍යක්ෂ (සංගීත) තනතුරට පත් වන්නේ 2002.10.16 දිනයි. කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 ක්‍රියාත්මක වන්නේ 2006.01.01 දින සිටයි. මම 2018.10.31 දින විශ්‍රාම යන තෙක් මගේ සේවා කාලය අනුව උවමනාවට වැඩිය වාහන බලපත්‍ර ඉල්ලා ගැනීමට අවස්ථාව තිබුණා. ඒ සඳහා ඉල්ලා සිටින්නේ මාව M M 1:1 වැටුප් කාණ්ඩයට අන්තර්ග්‍රහණය කර නැති නිසා දෙවනවරටත් වාහන බලපත්‍ර මට අහිමි වුණා. 2006.01.01 වන දිනවත් එම චක්‍රලේඛය ක්‍රියාත්මක වූවා නම් මට ඒ හිමිකම ලබා ගැනීමට හැකියාව තිබුණා.

ප්‍රඃ 2006 වර්ෂයේ සිට M M 1:1 වැටුප් තලය ක්‍රියාත්මක උනානම් තමාට වාහන බලපත්‍ර කීයක් ලැබෙන්න ඕනේ ද?

පිඃ රජයෙන් වාහන බලපත්‍ර දෙන වකවානු විටින් විට වෙනස් කළා. 2002 වර්ෂයේ සිට දුන්නා නම් සමහර විට වාහන බලපත්‍ර දෙන වකවානු විටින් විට වෙනස් කළා. 2002 වර්ෂයේ සිට දුන්නා නම් සමහර විට වාහන බලපත්‍ර දෙකකට වඩා ගැනීමට අවස්ථාව තිබුණා. 2006 වර්ෂයේ සිට මට වාහන බලපත්‍ර දෙකකට හිමිකම් තිබෙනවා.

ප්‍රඃ වාහන බලපත්‍ර වටිනාකම රුපියල් ලක්ෂ 39 ක් කීවොත් නිවැරදි ද?

පිඃ රුපියල් ලක්ෂ 39 හෝ ඊට ආසන්න මුදලක්.

මේ සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශ්වය ඉල්ලුම්කාරියගෙන් හරස් ප්‍රශ්න විමසමින් ආර් - 28 අංකයෙන් යුත් ලේඛනයක් සලකුණු කරන ලදී.

එය වර්ෂ 2018 ක් වූ පෙබරවාරි මස 15 දිනැතිව හා අංක 01/2018 දරන වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛයකි. මෙම ලේඛනයේ අන්තර්ගත කරුණු ඔප්පු කිරීමේ භාරයට යටත් කරන ලෙස ඉල්ලුම්කාර පාර්ශ්වය ඉල්ලා ඇත්තේ එය ප්‍රසිද්ධ ලේඛනයක් වශයෙන් සළකන බැවින් ඉල්ලීම බැහැර කරන ලදී.

ඒ කෙසේ වෙතත් එකී චක්‍රලේඛයේ 19 (1) උපවගන්තිය යටතේ" රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු මගින් අනුමත සේවක සංඛ්‍යාව තුළ ඇතුළත් 2016.04.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2/2016 හි III වන උපලේඛනයේ සඳහන් ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් විධායක තනතුරක වසර දොළහක ( 12 ) සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා තනතුරෙහි ස්ථිර කර ඇති නිලධාරින්ට හිමි විය යුතු බවත් එහෙත් 19:2(7) උපවගන්තිය ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත තනතුරු සම්බන්ධයෙන් බැහැරව ආයතනය විසින් ඇති කරන ලද තනතුරක සේවය කරනු ලබන නිලධාරින් මෙම හිමිකම යටතේ ආවරණය නොවන බවත් ඉතා පැහැදිලිව සඳහන් කර තිබේ.

එම නිසා ඊට අනුරූපව ඉල්ලුම්කාරිය සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍රයක් ලබා ගැනීමට හිමිකම් ලබන්නේ ද යන්න සළකා බැලිය යුතුව ඇත. මෙම නඩු විභාගයේ දී ඉල්ලුම්කාරිය ලබා දෙන ලද සාක්ෂි වලින් පැහැදිලි වන්නේ ඇය 2002.10.16 දින සිට ක්‍රියාත්මකවන පරිදි සහකාර අධ්‍යක්ෂ තනතුර ලබා තිබෙන බවයි. ඉන් පසුව අංක 30/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව ඇය 2006.01.01 දින සිට M M 1:1 කේතය යටතේ එනම් මධ්‍යම මට්ටමේ කළමනාකරණ තනතුරකට අදාළව වැටුප් ලැබීමට හිමිකම් ලබයි. එහෙත් මෙම තනතුර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් මධ්‍යම මට්ටමේ තනතුරක් ලෙස අනුමත කර තිබීම අත්‍යවශ්‍ය වේ. වගඋත්තරකාර පාර්ශ්වය විසින් නඩු විභාගයේ දී ආර් - 21 වශයෙන් සලකුණු කරන ලද ලේඛනය මගින් පැහැදිලි වන්නේ මෙම තනතුර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර ඇත්තේ 2010.12.13 වන දින සිට ක්‍රියාත්මක වන පරිදිය. මේ සම්බන්ධයෙන් ඉල්ලුම්කාර පාර්ශ්වය හබ කිරීමක් හෝ එම ප්‍රකාශය බැහැර කෙරෙන ආකාරයේ සාක්ෂි ඉදිරිපත් කිරීමක් හෝ නඩු විභාගයේ දී සිදු කර නැත. එම නිසා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2018 හි 1.9(1)

උපවගන්තිය යටතේ දැක්වෙන වසර 12ක සක්‍රීය සේවා කාලයක් ඉල්ලුම්කාරිය සපුරා නැත. එමෙන්ම ඒ සඳහා පසු කාලයේ දී හෝ ඇයට අවස්ථාව නොලැබෙනුයේ ඇය 2018.10.31 දින සිට ක්‍රියාත්මකවන පරිදි විශ්‍රාම ගන්වා ඇති බැවිනි. එපමණක් ද නොවේ මීට අදාළව වගඋත්තරකාර පාර්ශ්වය විසින් නඩු විභාගයේ දී සළකුණු කරන ලද ආර් - 21 දරන ලේඛනය ද මෙහි ලා වැදගත් වේ. එහි දෙවන ඡේදයේ දැක්වෙන්නේ ''ඒ අනුව ඔබ විසින් දරා ඇති සහකාර අධ්‍යක්ෂ (සංගීත) තනතුර ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ MM මට්ටමේ තනතුරක් ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කර ඇත්තේ 2010.12.13 දින සිට වන බවත් ඔබ විශ්‍රාම ගැනීමෙන් අනතුරුව 2006.09.22 දින සිට පෙරදාතම් කර ලබා දී ඇති MM මට්ටමේ තනතුරේ සේවා කාලය චක්‍රලේඛය ප්‍රකාරව බලපත්‍රයක් නිකුත් කිරීම සම්බන්ධයෙන් සළකා බැලීම සඳහා අදාළ කර ගැනීමට ප්‍රතිපාදන නොමැති බවක් දක්වා ඇත'' යනුවෙනි. මෙම ප්‍රකාශය ඉදිරිපත් කර ඇත්තේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්වරයා ය. එහි සත්‍ය අසත්‍ය භාවය හෝ යුක්ති සහගත භාවය පිළිබඳව කරුණු සොයා බැලීමට මෙම අධිකරණය වෙත බලතල පැවරී නැත. මන්දයත් එය රාජ්‍ය අමාත්‍යංශයක් වන බැවිනි. එසේම ඉල්ලුම්කාරිය වෙත සහනදායි පදනම මත හිමිවිය යුතු යැයි කියන වාහන බලපත්‍රයක් ලබා ගැනීම සළකා ඇත්තේ වගඋත්තරකාර ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව නොවේ. එම නිසා ඉල්ලුම්කාරිය විසින් තමාට වාහන බලපත්‍රයක් ලබා නොදීම සම්බන්ධයෙන් වගඋත්තරකාර ආයතනය වෙත ඉදිරිපත් කෙරෙන චෝදනාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව වගකීමට ලක් නොවන බවට තීරණය කරමි. ඒ අනුව දෙවන පාර්ශ්වය හෙවත් වගඋත්තරකාර පාර්ශ්වය විසින් පළමුවන පාර්ශ්වය හෙවත් ඉල්ලුම්කාර පාර්ශ්වය වෙත පහත සඳහන් ගෙවීම් සිදු කළ යුතු බවට නියෝග කරමි.

M M 1:1 වැටුප් පරිමාණය අනුව 2006.01.01 දින සිට 2018.05.13 දින දක්වා හිඟ වේතන වශයෙන් රු. 1,465,125.00 ද, විධායක ශ්‍රේණියේ නිලධාරින් සඳහා 2015.07.01 දින සිට 2018.05.13 දින දක්වා වූ කාලයට ගෙවිය යුතු විශේෂ දීමනාව වශයෙන් රු. 344,333.33 ද, විධායක මට්ටමේ නිලධාරින් සඳහාවන සන්නිවේදන දීමනාව වශයෙන් 2018.09.18 දින සිට 2018.10.31 දින දක්වා වූ කාලයට රු. 7166.66 ද, එකතුව රු. 1,816,624.99 (රු. දහ අට ලක්ෂ දහසය දහස් හයසිය විසි හතරකුත් සත අනූ නවය) වගඋත්තරකාර පාර්ශ්වය විසින් ඉහත සඳහන් මුදල ඉල්ලුම්කාරියට ගත හැකි වන සේ ගැසට් පත්‍රයේ පළ වූ දින සිට මසක් ඇතුළත හෝ ඊට පෙර මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස්වරයා වෙත තැන්පත් කළ යුතු බවට ද නියෝග කරමි. මෙයට අදාළ උපලේඛන මේ සමඟ අමුණා ඇත.

මෙම නියෝගය සාධාරණ සහ යුක්ති සහගත නියෝගයක් බව සහතික කරමි.

2023 ජූලි මස 20 වැනි දින දීය.

බේරුම්කරු.
ලෝරා සුමතිපාල.

ඇමුණුම

නඩු අංකය : ඒ/47/2019
IR/COM/05/2018/150

යමුනා විනෝදනී ද අල්විස්
අංක 275/1, පරණ නුවර පාර,
දළුගම, කැළණිය

*පළමු පාර්ශ්වය*

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

*දෙවන පාර්ශ්වය*

**වේතන පිළිබඳ උපලේඛනය**

| කාලය වකවානුව | ගෙවිය යුතු වැටුප | ගෙවූ වැටුප | වෙනස | මාස ගණන | හිඟ මුදල |
|---|---|---|---|---|---|
| 2006.01.01-2006.10.31 | 25,589.50 | 17,640.00 | 7949.50 | 10 | 79,495.00 |
| 2006.11.01-2006.12.31 | 26,210.00 | 18,100.00 | 8110.00 | 2 | 16,220.00 |
| 2007.01.01-2007.10.31 | 31,310.00 | 25,590.00 | 5720.00 | 10 | 57,200.00 |
| 2007.11.01-2008.10.31 | 32,045.00 | 26,065.00 | 5980.00 | 12 | 71,760.00 |
| 2008.11.01-2009.10.31 | 32,780.00 | 26,710.00 | 6070.00 | 12 | 72,840.00 |
| 2009.11.01-2010.10.31 | 33,705.00 | 27,355.00 | 6350.00 | 12 | 76,200.00 |
| 2010.11.01-2011.10.31 | 34,630.00 | 28,215.00 | 6415.00 | 12 | 76,980.00 |
| 2011.11.01-2012.10.31 | 35,555.00 | 28,860.00 | 6695.00 | 12 | 80,340.00 |
| 2012.11.01-2013.10.31 | 36,480.00 | 29,505.00 | 6975.00 | 12 | 83,700.00 |
| 2013.11.01-2014.10.31 | 37,405.00 | 30,150.00 | 7255.00 | 12 | 87,060.00 |
| 2014.11.01-2015.10.31 | 38,330.00 | 30,795.00 | 7535.00 | 12 | 90,420.00 |
| 2015.11.01-2015.12.31 | 39,255.00 | 31,440.00 | 7815.00 | 12 | 93,780.00 |
| 2016.01.01-2016.10.31 | 47,463.00 | 32,085.00 | 15,378.00 | 10 | 1,53,780.00 |
| 2016.11.01-2016.12.31 | 48,585.00 | 32,085.00 | 16,500.00 | 2 | 33,000.00 |
| 2017.01.01-2017.10.31 | 59,990.00 | 32,730.00 | 24,260.00 | 10 | 2,42,600.00 |
| 2017.11.01-2017.12.31 | 58,309.00 | 47,109.00 | 11,200.00 | 2 | 22,400.00 |
| 2018.01.01-2018.10.31 | 66,911.00 | 54,176.00 | 12,735.00 | 10 | 1,27,350.00 |
| | | | | | 14,65,125.00 |

**විධායක ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ විශේෂ දීමනාව**

| | |
|---|---|
| 2015.07.01 සිට | |
| 2015.12.31 දක්වා | 60,000 |
| 2016.01.01 සිට | |
| 2016.12.31 දක්වා | 1,20,000 |
| 2017.01.01 සිට | |
| 2017.12.31 දක්වා | 1,20,000 |
| 2018.01.01 සිට | |
| 2018.05.13 දක්වා | 44,333.33 |
| | 3,44,333.33 |

**සන්නිවේදන දීමනාව**

| | |
|---|---|
| 2018.09.18 සිට | |
| 2018.10.31 දක්වා | 7,166.66 |

බේරුම්කරු ලෝරා සුමතිපාල මහතා

EOG 08 - 0267

මගේ අංකය: IR/15/07/2011.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2016.04.07 දිනැති හා අංක 1961/29 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2016.04.05 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කෙන්ගල්ල, බලගොල්ල, අංක 261 හි පදිංචි අයි. එම්. පී. ඉලංගසිංහ මයා සහ කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 500 හි පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 3642 හා 2023.07.20 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 අගෝස්තු මස 10 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**බේරුම් කිරීමේ අංශය හා කාර්මික අධිකරණය**

*නඩු අංකය:* A 3642.
IR/15/07/2011.

අයි. එම්. පී. ඉලංගසිංහ මහතා,
අංක 261,
බලගොල්ල,
කෙන්ගල්ල,

*පළමු පාර්ශ්වය*

සහ

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
අංක 500,
ටී. බී. ජයා මාවත,
කොළඹ 10.

*දෙවන පාර්ශ්වය*

අතර ඇති කාර්මික ආරාවුල

**ප්‍රදානයයි**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න මහතා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව ඉහත නම් සඳහන් පාර්ශ්වයන් අතර වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2016.04.05 වන දින බේරුම්කරු වශයෙන් මා පත් කරන ලදී.

කම්කරු කොමසාරිස් විසින් 2016.01.03 වන දින ගොණු කරන ලද අංක 1R/15/07/2011 දින දරන ලේඛනය අනුව ඉහත නම් සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වන්නේ,

"ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සේවය කරන අයි. එම්. පී. ඉලංගසිංහ මහතාට 2005.01.01 දින සිට ජේෂ්ඨත්වය අනුව තනතුර නොලැබීයාමෙන්, යම් අගතියක් සිදු වූයේද? එසේ නම් කුමන සහනයක් හිමිවිය යුතුද යන්න වේ."

මෙම කාර්මික ආරාවුල අංක 3492 යටතේ කාර්මික අධිකරණයේ බේරුම්කාර අංශයට යොමු කර තිබී ඇති අතර එහිදී ඉල්ලුම්කරුගේ මූලික සාක්ෂිය ලබා දී හරස් ප්‍රශ්න අඩක් අවසන් කර තිබියදී බේරුම්කරු විදේශ ගතවීම නිසා මෙම ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම පිණිස කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් 2016.04.05 දාතමින් මා වෙත යොමුකරන ලදී. දෙපාර්ශ්වය විසින් විස්තර ප්‍රකාශ ගොණු කිරීමෙන් පසු මෙම ආරාවුල සමථයකට පත් කිරීමට හැකියාවක් තිබේදැයි විමසා බැලුවද එවැනි හැකියාවක් නොතිබූ නිසා මෙම ආරාවුල පිළිබඳ තීරණයක් ගැනීම සඳහා සාක්ෂි විමසීමට තීරණය කළෙමි.

ඒ අනුව 2016.10.25 වන දින ඉල්ලුම්කරුද ඔහු වෙනුවෙන් නියෝජිත ග්‍රේෂන් සිල්වා මහතාද දෙවන පාර්ශ්වය නියෝජනය කරමින් පරිපාලන නිලධාරිනි ශ්‍රියාලතා බ්‍රියට්‍රිස් මහත්මිය සමග කළමණාකාර සහයක තිලිනුවන් කුලසේකර මහතාද නීතිඥ චමිලා කරුණාරත්න මහත්මියද පෙනී සිටින ලද අතර එදින ඉල්ලුම්කරු සිය මූලික සාක්ෂිය ලබා දීම ආරම්භ කරන ලදී. එදින මූලික සාක්ෂි වලින් කොටසක් ලබා දෙන ලද අතර 2017.03.10 දිනද 2017.08.04 දිනද , 2017.10.06 දිනද මූලික සාක්ෂි ලබා දෙන ලදී. ඉල්ලුම්කරුගේ මූලික සාක්ෂියේදී A1 සිට A46 දක්වා වූ ලේඛනද ලකුණු කරන ලදී.

ඉල්ලුම්කරු සිය මූලික සාක්ෂියේදී ප්‍රකාශ කළේ තමාට අදාල තනතුරු වලට සුදුසුකම් තිබියදී නිසි කාලය තුළ අදාල උසස්වීම් ලබා නොදීමෙන් අසාධාරණයක් සිදු වූ බවය. ඒ අනුව ඉල්ලුම්කරු ඉල්ලා සිටින ලද්දේ 2005.01.01 දිනට සහකාර අධ්‍යක්ෂ (පිරිස් හා පාලන) තනතුරට උසස් කිරීම 2009.08.01 දින සිට නියෝජ්‍ය අධ්‍යක්ෂ (පිරිස් හා පාලන) තනතුරට උසස් කිරීම, 2011.08.01 දින සිට අධ්‍යක්ෂ (පිරිස් හා පාලන) තනතුරට උසස් කිරීමද එම තනතුරු වලට අදාල හිඟ වැටුප් ලබා දෙන ලෙසත් වේ.

ඉල්ලුම්කරු මූලික සාක්ෂියේදී A1 සිට A46 දක්වා ලේඛන ලකුණු කර ඉදිරිපත් කරන ලදී. දෙවන පාර්ශ්වයේ ස්ථාවරය වී ඇත්තේ පරිපාලන නිලධාරි (1 ශ්‍රේණියේ) යන තනතුරින් උසස් විය හැකි තනතුරු වන සහකාර අධ්‍යක්ෂක (පිරිස් හා පාලන) නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකරණ (පාලන හා මුදල්) යන තනතුරු ලබා දීමේදී ජේෂ්ඨත්වය මත පමණක් නොව සුදුසුකම් හා සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල අදාළ වන බවත් ය. 2005 හා 2009 වර්ෂවලදී ඉහත කී තනතුරු ලබා දීමේදී ඉල්ලුම්කරු නොසලකා වෙනත් නිලධාරීන්ට එම තනතුරු ලබා දුන්නේය යන්න දෙවන පාර්ශ්ව ප්‍රතික්ෂේප කර ඇති අතර ඉල්ලුම්කරුට අදාළ තනතුර නොලැබුනේ ඔහුට ඒ සඳහා අවශ්‍යවන සුදුසුකම් නොතිබීම නිසා බව දෙවන පාර්ශ්වයේ ස්ථාවරය විය.

දෙපාර්ශ්වය වෙනුවෙන් ඉල්ලුම්කරු හරස් ප්‍රශ්න අසන ලද අතර 2018.09.20 දින ඔහුගේ සාක්ෂිය අවසන් වීමෙන් පසු දෙවන පාර්ශ්වය වෙනුවෙන් පරිපාලන නිලධාරිනී ශ්‍රියාලතා බියට්‍රිස් මහත්මිය සාක්ෂියට කැඳවන ලදී. 2019.09.20 වන දින පළමු පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂිකාරියගෙන් හරස් ප්‍රශ්න අසන ලද අතර වැඩි දුරටත් හරස් ප්‍රශ්න වලට මුහුණ දීම සඳහා එම සාක්ෂිකාරිය නොපැමිණියා ය. දෙවන පාර්ශ්වය කියා සිටියේ ඒ වන විට විශ්‍රාම ගොස් සිටින එම සාක්ෂිකාරිය සාක්ෂි දීම සඳහා පැමිණීමට විවිධ කොන්දේසි ඉදිරිපත් කරන බවය. දෙවන පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි දීම සඳහා වෙනත් සාක්ෂියක් කැඳවීමට කරන ලද ඉල්ලීමට පළමු පාර්ශ්වයද එකගතාවක් ඇතිව ඉඩ ලබා දෙන ලදී. ඒ අනුව 2020.06.16 දාතමින් පරිපාලන නිලධාරී එම්. කේ වීරසිංහ මහතා මූලික සාක්ෂිය අඩංගු දිවුරුම් පෙත්සමක් ගොණු කරන ලදී. එම සාක්ෂිකරු සාක්ෂි දීමට නියමිතව තිබියදී ඉල්ලුම්කරු මියගොස් ඇති බවත් ඒ අනුව මෙම නඩු කටයුත්ත අවසන් කරන ලෙසත් ඉල්ලා 2022.09.05 දින මෝසමක් ගොණු කරන ලදී. ඉල්ලුම්කරු වෙනුවෙන් ඔහුගේ බිරිඳ ඉල්ලුම්කරුගේ මරණ සහතිකයද, විවාහ සහතිකයද සහිත දිවුරුම් ප්‍රකාශයක් ගොණු කරමින් ඉල්ලා සිටින ලද්දේ ඉල්ලුම්කරුට සහනයක් ලබා දෙන්නේ නම් එය ඇය වෙත ලබා දෙන ලෙස ය. දෙවන පාර්ශ්වය එම ඉල්ලීමට විරෝධතාව පල කරන ලද අතර එම කරුණ සම්බන්ධයෙන් ලිඛිත දේශන ඉදිරිපත් කිරීමට දෙපාර්ශ්වයට අවස්ථාව සලසා දෙන ලදී. දෙපාර්ශ්වය වෙනුවෙන් ඉදිරිපත් කල කරුණු සලකා බලා මා තීරණය කරන ලද්දේ ඉල්ලුම්කරුගේ සාක්ෂියේ හරස් ප්‍රශ්න වලට ද භාජනය වී එම සාක්ෂිය අවසන් වී ඇති තත්වයක් තුළ ඉල්ලුම්කරුගේ මරණය හේතු කරගෙන මෙම නඩුව නිශ්ප්‍රභා කිරීම මගින් ඉල්ලුම්කාර පාර්ශ්වයට අසාධාරණයක් වන බවය.

දැනට ඉදිරිපත් වී ඇති සාක්ෂි හා ලේඛන අනුව තීරණයක් ලබා දීමට ප්‍රධාන ආරාවුලට අදාළ ලිඛිත දේශන ඉදිරිපත් කිරීමට දෙපාර්ශ්වයට දැනුම් දෙන ලදී. ඒ අනුව එම ලිඛිත දේශනද ඉදිරිපත් වී ඇති සාක්ෂි හා ලේඛන ද පිළිබඳව අවධානය යොමු කළෙමි. ඉල්ලුම්කරු සිය සාක්ෂියේදී A1 සිට A4 දක්වා ලේඛන ඉදිරිපත් කරන ලදී. එම ලේඛන සලකා බැලීමේදී පැහැදිලි වන්නේ A1 සිට A24 දක්වා වූ ලේඛන මෙම ආරවුලට තුඩු දුන් කාරණාවලට අදාල ලේඛන නොවන බවය. මෙම කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණ වන්නේ ඉල්ලුම්කරුට 2005.01.01 දින සිට ජේෂ්ඨත්වය අනුව තනතුරු නොලැබීයාමෙන් ඔහුට යම් අගතියක් සිදු වූයේද යන්න වේ.

ඒ අනුව,

1. 2005.01.01 දින සිට සහකාර අධ්‍යක්ෂක (පිරිස් හා පාලන) තනතුර

2. 2009.08.01 දින සිට නියෝජ්‍ය අධ්‍යක්ෂක (පිරිස් හා පාලන) තනතුර

3. 2011.08.01 දින සිට අධ්‍යක්ෂක (පිරිස් හා පාලන) තනතුර

මා අවධානය යොමු කලේ අදාල අවස්ථා වලදී එම තනතුර ලබා නොදීමෙන් ඉල්ලුම්කරුට අගතියක් සිදු වී තිබේද යන්නයි.

අදාල තනතුරු ලබා දීමට නියමිත අවස්ථාවේ නියමිත සුදුසුකම් ඉල්ලුම්කරු සපුරා තිබුනේද යන්න පිලිබඳව අවධානය යොමු කළෙමි. ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න අසන අවස්ථාවේ ඉල්ලුම්කරු පිළිගන්නා ලද්දේ මීන් පෙර පැවති A 3097 බේරුම්කර නඩුවේදී ඇති කරගන්නා ලද සමථය ප්‍රකාරව හිග වැටුප් ගෙවීමකින් තොරව 1994.03.01 ට දිනට පරිපාලන නිලධාරී 3 ශ්‍රේණියට උසස් කිරීම, 1998.03.01 ට දිනට පරිපාලන නිලධාරී 2 ශ්‍රේණියට උසස් කිරීම, 2002.03.01 දිනට පරිපාලන නිලධාරී 1 වන ශ්‍රේණියට උසස් කිරීම සිදු වූ බව ඉල්ලුම්කරු පිළිගත්තේය. (2018.03.15 සාක්ෂි සටහන 4 වන පිටුව)

සහකාර අධ්‍යක්ෂක (පිරිස් හා පාලන) තනතුර ලබා දීම සඳහා අවශ්‍ය සුදුසුකම් වන්නේ (R2) A යටතේ ඩිප්ලෝමාවක් තිබීම හා පළමුවන ශ්‍රේණියේ පරිපාලන නිලධාරි තනතුරේ අවුරුදු 6 ක පළපුරුද්ද ලබා තිබීම හෝ පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සහිත වසර 14 ක පළපුරුද්ද වේ.

ඒ වන විට ඉල්ලුම්කරුට වසර 14 ක පළපුරුද්ද නොතිබූ බව ඉල්ලුම්කරු පිළිගත්තේය. කලින් පැවති බේරුම්කරණ නඩුවේ සමථය අනුව ඉල්ලුම්කරුට 1 වන ශ්‍රේණියේ පරිපාලන නිලධාරි තනතුර හිමිව ඇත්තේ 2002.03.01 දින සිටය. 2005 වන විට ඉල්ලුම්කරු එම තනතුරේ සේවය කර ඇත්තේ වසර 3 කට ආසන්න කාලයක් ය.

2009.08.01 දින සිට නියෝජ්‍ය අධ්‍යක්ෂක (පිරිස් හා පාලන) තනතුර ලබා නොදීමෙන් අසාධාරණයක් වූ බව ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇත. දෙවන පාර්ශ්වය ප්‍රකාශ කරන්නේ එම තනතුරට අදාල සුදුසුකම් සපුරා නොතිබූ බවය. ඊට අදාල A05 ලේඛනය ලකුණු කරන ලදී. එම ලේඛණය අනුව එම තනතුර සඳහා සහකාර කළමනාකරු/ සහකාර අධ්‍යක්ෂක තනතුරේ අවම වශයෙන් වසර 4 ක් සේවය කර තිබීම හෝ පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධිය හෝ පරිපාලන මට්ටමේ වසර 18 ක පළපුරුද්ද යන සුදුසුකම් සපුරා තිබිය යුතුය. ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න අසන ලද අවස්ථාවේදී,

ප්‍රඃ මහත්මයා මේ ලේඛනයේ සඳහන් වෙලා තියෙන ආකාරයට A හෝ B කොටසේ සඳහන් කරල තියෙන සුදුසුකම් 2009.08.01 දින වන විට සපුරා නැහැ නේද?

උඃ සුදුසුකම් සපුරා ගැනීමට මට අවස්ථාවක් ලබා දුන්නෙ නැහැ. උදාහරණ වශයෙන් අධිකාරියේ පරිපාලනය විසින් ඒ අවස්ථාව වන විට සහකාර අධ්‍යක්ෂක තනතුර ලබා දී තිබුනේ නැහැ. එසේම 2011.08.01 දින සිට අධ්‍යක්ෂක (පිරිස් හා පාලන) තනතුරට උසස් වීම ලබා නොදීම යන කාරණය සම්බන්ධයෙන් 2 වන පාර්ශ්වය එම තනතුරට අදාල සුදුසුකම් අඩංගු ලේඛනය A6 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද අතර ඒවන විට ඉල්ලුම්කරු පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා තිබුණද මාණ්ඩලික මට්ටමේ අවුරුදු 20 ක පළපුරුද්දක් නොතිබී ඇත.

තවද දෙවන පාර්ශ්වය සදහන් කළ කාරණයක් නම් අදාළ උසස්වීම් ලබා දීමේදී අදාළ වන්නා වූ නීති රෙගුලාසීන්ට අනුකූලව හුදෙක් ජ්‍යේෂ්ඨත්වය පමණක් නොව කුසලතාවයන් හා සම්මුඛ පරීක්ෂණ නිර්දේශයන් ද සැලකිල්ලට ගනිමින් මූලික සුදුසුකම් සපුරා තිබීම අත්‍යාවශ්‍ය සාධකයක් වන බවයි. A3 ලෙස සළකුණු කරන ලද ලේඛනය අනුව උසස් වීමක් ලබා දීමේදී ලිඛිත පරීක්ෂණයක් නොපැවැත්වෙන බවත් සම්මුඛ පරීක්ෂණයක් පවත්වන බවත් ය. එම සම්මුඛ පරීක්ෂණයේදී කුසලතා හා පුරප්පාඩු යන කරුණුවලට අමතරව එක් එක් පුද්ගලයාගේ කුසලතා සැලකිල්ලට ගන්නා බවය.

ඉල්ලුම්කරු අදාළ බඳවා ගැනීමේ හා උසස් වීමේ කාර්ය පටිපාටීන්හි දක්වා ඇති මූලික සුදුසුකම් සපුරා නොතිබීම නිසා අදාළ සම්මුඛ පරීක්ෂණයන්හිදී සතුටුදායක කුසලතාවයන් සම්පූර්ණ කර නොතිබීම නිසාත් අදාළ උසස්වීම් ලබා නොදුන් බවට දෙවන පාර්ශ්වය සඳහන් කරන කාරණ පිළිගැනීමට සිදු වේ.

තවද ඉල්ලුම්කරු 2012.01.31 වන දින විශ්‍රාම ලබා තිබීම හා විශ්‍රාම ලැබීමෙන් පසු ඔහුට හිමිවිය යුතු පාරිතෝෂික මුදල් නිසි පරිදි ගෙවා තිබීමද සැලකිල්ලට ගතිමි. ඉල්ලුම්කරු ඉල්ලා ඇති උසස්වීම් පෙරදාතමින් ලබාදීම සිදු කළ නොහැකි බවට දෙවන පාර්ශ්වයේ ස්ථාවරය පිළිගනිමි. ඒ අනුව ඉල්ලුම්කරුට 2005.01.01 දින සිට ජ්‍යේෂ්ඨත්වය අනුව තනතුරු නොලැබී යාමෙන් අගතියක් සිදු වී නොමැති බව තීරණය කරමින් ඉල්ලුම්කරුගේ ඉල්ලීම නිශ්ප්‍රභා කරමි. එසේම මෙම තීරණය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බව සඳහන් කරමි.

බේරුම්කරු,
නීතිඥ සරත් ලියනගේ.

2023 ජූලි මස 20 වැනි දින.

BOG 08-0268

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.